# 2017 කාර්ය සාධන වාර්තාව

ජාතික අයවැය දෙපාර්තමේන්තුව
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## පටුන


| පරිච්ඡේද අංකය | | විෂයය | පිටුව |
|---|---|---|---|
| **01.** | | **සමාලෝචනය** | 01 |
| | 1.1 | දැක්ම | 01 |
| | 1.2 | මෙහෙවර | 01 |
| | 1.3 | අරමුණු | 01 |
| | 1.4 | කාර්යයන් සහ වගකීම් | 02 |
| | 1.4.1 | ජාතික අයවැය සකස් කිරීම | 02 |
| | 1.4.2 | ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම | 03 |
| | 1.4.3 | අත්තිකාරම් ගිණුම් කටයුතු | 03 |
| | 1.4.4 | අයවැය අධීක්ෂණය කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම | 03 |
| | 1.4.5 | වැඩසටහන් / ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදනය | 04 |
| **02.** | | **2017 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම** | 07 |
| | 2.1 | 2017 සඳහා විසර්ජන පනත | 07 |
| | 2.2 | 2016 අංක 24 දරණ විසර්ජන පනතට සංශෝධන | 08 |
| | 2.3 | පරිපූරක ඇස්තමේන්තු | 08 |
| | 2.4 | පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර | 08 |
| | 2.5 | 2017 අයවැයෙහි කාර්ය සාධනය | 09 |
| | 2.6 | අත්තිකාරම් ගිණුම් කටයුතු | 13 |
| | 2.7 | 2017 අයවැය කළමනාකරණය | 13 |
| | 2.7.1 | අරමුදල් මාරු කිරීම | 13 |
| | 2.7.2 | පරිපූරක සහාය සේවා සහ හදිසි වගකීම් | 13 |
| | 2.7.3 | අයවැය චක්‍රලේඛ නිකුත් කිරීම | 14 |
| **03.** | | **2018 සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීම** | 15 |
| | 3.1 | අයවැය සකස් කිරීමේ මාර්ගෝපදේශ | 15 |
| **04.** | | **විශේෂ ක්‍රියාකාරකම්** | 16 |
| | 4.1 | රාජ්‍ය ආයතනවල අයවැය කළමනාකරණය | 16 |
| | 4.2 | අමාත්‍ය මණ්ඩල සංදේශ | 16 |
| | 4.3 | මණ්ඩල හා කමිටුවල කාර්ය මණ්ඩල සහභාගිත්වය | 17 |

| | | | |
|---|---|---|---|
| **05.** | | **ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය හා කාර්ය භාරය** | 17 |
| | 5.1 | කාර්ය මණ්ඩලය | 17 |
| | 5.2 | මානව සම්පත් සංවර්ධනය | 19 |
| | 5.2.1 | විදේශ පුහුණු / සම්මන්ත්‍රණ / රැස්වීම් | 19 |
| | 5.2.2 | දේශීය පුහුණු | 22 |
| | 5.3 | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය | 26 |
| | 5.3.1 | 2017 වර්ෂය සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | 26 |
| | 5.3.2 | 2017 සඳහා විගණකාධිපතිගේ විමසුම් | 27 |
| | 5.4 | සංවිධාන ව්‍යුහය | 28 |

# 1. සමාලෝචනය

පාර්ලිමේන්තු පනත්හි ප්‍රතිපාදන යටතේ පිහිටුවන ලද නෛතික රාමුවක් තුළ සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මගපෙන්වීම යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක වේ. සමස්ත මධ්‍යකාලීන සාර්ව ආර්ථික රාමුවට අනුකූලව ආංශික මධ්‍යකාලීන වියදම් රාමුවක් (MTEF) මත පදනම්ව අයවැය සකස් කිරීමේ කේන්ද්‍රීය ස්ථානය ලෙස දෙපාර්තමේන්තුව කටයුතු කරයි. රාජ්‍ය වියදම් කළමනාකරණය කෙරෙහි විශේෂිත අවධානයක් යොමු කරමින් ආංශීය ප්‍රතිපත්ති උපාය මාර්ග සන්දර්භය තුළ විශේෂිත ඉලක්ක වෙත මධ්‍යකාලීන වියදම් රාමුව එහි මූල්‍ය සැළසුම් ඉදිරිපත් කරනු ලැබේ. රේඛීය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රජයේ ව්‍යවස්ථාපිත ආයතන සහ අදාළ භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග නිරන්තර තොරතුරු විමසීම්හි මෙම ක්‍රියාවලිය නිරත වේ.

## 1.1 දැක්ම

"රාජ්‍ය සම්පත් කාර්යක්ෂම ලෙස ප්‍රතිපාදනය හා කළමනාකරණය තුලින් සමාජ - ආර්ථික සංවර්ධනය."

## 1.2 මෙහෙවර

රජයේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගනිමින් රාජ්‍ය භාණ්ඩ සහ තෝරාගත් සේවාවන් ඵලදායී ලෙස බෙදා හැරීම සඳහා රාජ්‍ය මූල්‍ය සම්පත් ඇස්තමේන්තුගත කිරීම සහ විසර්ජනය කිරීම.

## 1.3 අරමුණු

- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා මූල්‍ය සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස ප්‍රතිපාදනය කිරීම තුළින් මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම.
- මූල්‍ය විනය පවත්වා ගැනීම
- මූල්‍ය ඒකාබද්ධතාවය තහවුරු කිරීම
- රාජ්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය සීමාවන්ට යටත්ව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ වෙනත් රාජ්‍ය ආයතන සහ ව්‍යවස්ථාපිත ආයතන සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.

## 1.4 කාර්යයන් සහ වගකීම්

### 1.4.1 ජාතික අයවැය සකස් කිරීම

- අයවැය ක්‍රියාවලිය සැලසුම් කිරීම පිළිබඳව භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සමග සාකච්ඡා පැවැත්වීම
- අයවැය සඳහා වූ සාර්ව ආර්ථික රාමුව සැකසීම
- අයවැය සඳහා වූ සාර්ව ආර්ථික රාමුව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- අයවැය කැඳවීම/අයවැය ලිපි ඉදිරිපත් කිරිම
- වියදම් ඒකක හා සාකච්ඡා කර කෙටුම්පත් ඇස්තමේන්තු සැකසීම
- වියදම් ඒකක, ආදායම් දෙපාර්තමේන්තු හා පෞද්ගලික අංශය සමග අයවැය සාකච්ඡා මෙහෙයවීම
- ආදායම, වියදම, මූල්‍යකරණ හා ණය ගැනීම් සීමාවන් (දේශීය හා විදේශීය) නිගමනය කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ කටයුතු නිම කිරීම
- විසර්ජන පනත් කෙටුම්පත සඳහා නීති කෙටුම්පත් සම්පාදකගේ හා නීතිපතිගේ අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත් කෙටුම්පත රජයේ ගැසට් පත්‍රයේ පලකිරීම
- විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම (පළමුවර කියවීම)
- සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් මුද්‍රිත කෙටුම්පත් අයවැය ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය යෝජනා පිළිබඳව අමාත්‍ය මණ්ඩලය සමග සාකච්ඡා කිරීම
- අයවැය කථාව -දෙවනවර කියවීම -අයවැය යෝජනා සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීම
- දෙවනවර කියවීමේ විවාදය, ඡන්දය විමසීම හා අනුමැතිය
- විසර්ජන පනත් කෙටුම්පතේ සහ කෙටුම්පත් ඇස්තමේන්තුවේ යෝජිත වෙනස් කිරීම් ලැයිස්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම
- අයවැය තෙවනවර කියවීම -කාරක සභා විවාද අවස්ථා, ඡන්දය විමසීම හා අනුමැතිය ලබාගැනීම
- විසර්ජන පනත සඳහා ගරු කථානායකතුමාගේ අනුමැතිය ලබාගැනීම

- වොරන්ට් බලපත්‍රය සකස් කිරීම හා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම (දෙසැම්බර් 31 දිනට පෙර)

- වියදම් ඒකක හා ආදායම් දෙපාර්තමේන්තු වෙත වියදම් දැරීම සඳහා බලය ලබාදීමේ චක්‍රලේඛය නිකුත් කිරීම

### 1.4.2 ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් කටයුතු වාර්ෂිකව සිදුකරනු ලැබේ.

- අයවැය ක්‍රියාත්මක කිරීමට බලය ලබාදීම ඇතුලත්ව අදාළ උපදෙස් හා චක්‍රලේඛ නිකුත් කිරීම
- අනුමත අරමුදල් සීමාවන් තුළ සුදුසු අරමුණු වෙනුවෙන්ම එම මුදල් ඵලදායීව යොදා ගැනෙන බව සහ මූල්‍ය විනය පවත්වාගෙන යනු ලබන බව තහවුරු කිරීම සඳහා ක්‍රමවේදයක් බලාත්මක කිරීම.
- ක්‍රියාත්මක කිරීමේ කාර්යක්ෂමතාවය තහවුරු කිරීම පිණිස වියදම් කිරීමේ ආයතන සමග අන්‍යෝන්‍යව කටයුතු කිරීම.
- ව්‍යවස්ථාපිත මණ්ඩල වෙනුවෙන් මුදල් නිදහස් කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට නිර්දේශ කිරීම.
- මූල්‍ය සම්පත් වෙන්කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරීක්ෂණ කෙටුම්පත් කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ, රාජ්‍ය මුදල් කාරක සභාවේ සහ රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ සහ වෙනත් පාර්ලිමේන්තු රැස්වීම්වලදී මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා විසින් කැඳවනු ලබන රැස්වීම්වලදී සහ වියදම් කිරීමේ ආයතන මගින් සංවිධානය කරනු ලබන රැස්වීම්වලදී මහා භාණ්ඩාගාරය නියෝජනය කිරීම.
- විසර්ජන පනතේ 6 වගන්තිය යටතේ ප්‍රතිපාදන මාරු කිරීම.
- අදාළ අමාත්‍යාංශ මගින් ක්‍රියාත්මක කරනු ලබන අයවැය යෝජනාවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- වාර්ෂික ඇස්තමේන්තු සුදුසු ලෙස ක්‍රියාත්මක වීම තහවුරු කිරීම සඳහා මු.රෙ.66 සහ මු.රෙ.69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම සඳහා අනුමැතිය ලබාදීම.

### 1.4.3 අත්තිකාරම් ගිණුම් කටයුතු

- වාණිජ, ගබඩා සහ රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සඳහා සීමා නිර්ණය කිරීම සහ වියදම් කිරීමේ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් පදනම් කරගෙන එම ගිණුම්වල සීමා සංශෝධනය කිරීම.

### 1.4.4 අයවැය ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම

- අයවැය අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීමට අදාළව උපදෙස් සහ චක්‍රලේඛ නිකුත් කිරීම.
- අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි සංවර්ධන ව්‍යාපෘති හා අයවැය යෝජනාවලට අදාළ මූල්‍ය සහ භෞතික කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

### 1.4.5 වැඩසටහන් / ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදනය

- අයවැය යෝජනා යටතේ ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා යෝජනා කරන නව වැඩසටහන් / ව්‍යාපෘති සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනය කිරීම.
- සමාජ-සුබසාධන කටයුතු සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන යළි පැවරීම.
- ආපදා සහන සහ වෙනත් අත්‍යවශ්‍ය කටයුතු සහ හදිසි අවශ්‍යතා සඳහා මූල්‍ය සම්පත් වෙන් කිරීම.

**1. වගුව - කාර්ය සාධනයේ සාරාංශය 2017**

| කාර්යය | ක්‍රියාකාරකම් | සමස්ත ඉලක්කය | කාර්යසාධනය |
|---|---|---|---|
| 1.<br>2017 අයවැය ක්‍රියාත්මක කිරීම හා වියදම් කළමනාකරණය | වියදම් පාලනය පිළිබඳ උපදෙස් ලබාදෙමින් චක්‍රලේඛ නිකුත් කිරීම | කාර්යක්ෂම ලෙස රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම | මේ සම්බන්ධව අංක 5/2016 දරණ ජාතික අයවැය චක්‍රලේඛය (2017 අයවැය වියදම් සඳහා බලය ලබාදීම හා රාජ්‍ය වියදම් කළමනාකරණය) නිකුත් කරන ලදී. |
| | කලින් සැළසුම් නොකළ වියදම් වෙනුවෙන් අමතර ප්‍රතිපාදන ලබාදීම හා පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම | අනවශ්‍ය වියදම් අවම කරගනිමින් අරමුදල් කළමනාකරණය කිරීම | ගංවතුර, නියඟ වැනි අනපේක්ෂිත අවස්ථාවන් සඳහා වන වියදම් පියවා ගැනීමට පරිපූරක ඇස්තමේන්තු පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර, අනුමත වියදම් රාමුව තුල පවතින ප්‍රතිපාදන නැවත වෙන්කිරීම මගින් එම අමතර අරමුදල් අවශ්‍යතා සපුරාලීම. |
| | විසර්ජන පනතේ 5(1) වගන්තිය සහ මු.රෙ.66 හා 69 යටතේ අරමුදල් මාරු කිරීම සඳහා අවසරය ලබාදීම | අනුමත ඇස්තමේන්තුව තුල වියදම් කළමනාකරණය | එකී රෙගුලාසි අනුව ඉල්ලීම් 1602 ක් සඳහා අවසර ලබාදෙන ලදී. ඒ අතරින් 218 ක් වැඩසටහන් අතර මාරු කිරීම වූ අතර, 1384 ක් ව්‍යාපෘති අතර මාරු කිරීම් විය. මු.රෙ. 69 යටතේ අනුමැතිය ලබාදුන් ඉල්ලීම් ප්‍රමාණය 72 කි. |

| | | | |
|---|---|---|---|
| | 2016 අංක 24 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම | විසර්ජන පනතේ 2(1) (ආ) වගන්තිය සංශෝධනය කිරීම (ණය ගැනීමේ සීමාවන්)<br><br>විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.<br><br>විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව මගින් සම්මත කිරීම | විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත, 2017.09.17 දිනැති ගැසට් පත්‍රයේ පළකිරීම.<br><br>2017.12.11 වන දින විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2017.12.11 දින දෙවන වර කියවීම<br><br>2017.12.11 වන දින විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.<br><br>2017.12.14 දින 2017 අංක 32 දරණ විසර්ජන (සංශෝධන) පනත ගරු කතානායකතුමන් විසින් සහතික කරන ලදී. |
| 2.<br>2018 සඳහා ජාතික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා අයවැය මාර්ගෝපදේශ නිකුත් කිරීම. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ සහිතව අයවැය කැඳවුමක් නිකුත් කිරීම | අයවැය චක්‍රලේඛය 2017.07.25 දින නිකුත් කරන ලදී.<br><br>මධ්‍යකාලීන වියදම් රාමුව 2018-2020 තුළ රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට අනුගත වෙමින් 2018 වර්ෂය සඳහා අයවැය සකස් කරන ලදී. |
| | භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු හා වියදම් කිරීමේ ආයතන සමග සාකච්ඡා කර වාර්ෂික අයවැය ඇස්තමේන්තු කෙටුම්පත් සැකසීම. | රජයේ ආර්ථික හා සංවර්ධන අරමුණුවල ආර්ථික ඉලක්ක සපුරා ගැනීම තහවුරු කිරීම. | ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් පාර්ශ්වකරුවන් සමග අයවැය පූර්ව සාකච්ඡා පවත්වන ලදී. |
| | අදාළ අමාත්‍යාංශ සමග අයවැය සාකච්ඡා පැවැත්වීම | සැබෑ අවශ්‍යතා හඳුනාගෙන යථාර්තවාදී අයවැයක් සැකසීම. | භාණ්ඩාගාර ලේකම්, නියෝජ්‍ය ලේකම්වරු හා අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සමග ආයතන අතර සමාලෝචන සාකච්ඡා පවත්වන ලදී. |

| | | | |
|---|---|---|---|
| | 2018 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත නියමිත දිනට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම | 2017 ඔක්තෝබර් තුන්වන සතියේ විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම<br><br>විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවෙන් සම්මත කිරීම<br><br>විස්තරාත්මක ඇස්තමේන්තු සකස් කිරීම හා මුද්‍රණය කිරීම | 2017.09.15 දින 2018 සඳහා වූ විසර්ජන පනත් කෙටුම්පත ගැසට් පත්‍රයේ පළකිරීම.<br><br>2017.10.09 දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2017.11.09 වන දින අයවැය (දෙවන වර) කියවීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.<br><br>2017.12.09 වන දින විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.<br><br>2017.12.09 දින 2017 අංක 30 දරණ විසර්ජන පනත ගරු කතානායකතුමන් විසින් සහතික කරන ලදී.<br><br>2017.12.13 දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් වොරන්ට් බලපත්‍ර නිකුත් කරන ලදී.<br><br>අදාළ සියළුම වියදම් කිරීමේ ආයතන සැළකිල්ලට ගෙන පසුබිම් තොරතුරු ඇතුලත්ව විස්තරාත්මක ඇස්තමේන්තු මුද්‍රණය කරන ලදී. |
| 3. අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ ලබාදීම | රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණ ආයෝජන විශ්ලේෂණය කරමින් අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ හා අර්ථ නිරූපණ කෙටුම්පත් කිරීම සහ නියමිත දිනට ලබාදීම. | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳ නිරීක්ෂණ නියමිත දිනට ඉදිරිපත් කිරීම | වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල සංදේශ 411 ක් සඳහා නිරීක්ෂණ ලබාදෙන ලදි. තවද, වෙනත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තු විසින් නිරීක්ෂණ ලබාදෙන අමාත්‍ය මණ්ඩල සංදේශ 504 ක් සඳහා අදහස් දැක්වීම් සිදුකර ඇත. |
| 4. ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කළමනාකරණය. | වාර්තා ඉදිරිපත් කිරීම | අවසන් දිනට පෙර වාර්තා ඉදිරිපත් කිරීම<br><br>(අ) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව සඳහා වියදම් සමාලෝචනය ලබාදීම<br>(ආ) දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව<br>(ඇ) විසර්ජන ගිණුම<br>(ඈ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම | (අ) වියදම් සමාලෝචනය 2017 අමාත්‍යාංශයට ලබාදීම<br>(ආ) කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම<br>(ඇ) විසර්ජන ගිණුම් 2017<br>(ඈ) රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් සැසඳීම 2017 යන වාර්තා නියමිත දිනට ලබාදෙන ලදී. |

| | | | |
|---|---|---|---|
| | හැකියා ප්‍රවර්ධනය | දේශීය හා විදේශීය පුහුණු මගින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්වලට අදාළ වැඩසටහන් පිළිබඳව නිලධාරීන් 30 දෙනෙකු සඳහා විදේශ පුහුණුව හා නිලධාරීන් 84 දෙනෙකු සඳහා දේශීය පුහුණු අවස්ථා ලබාදෙන ලදී. |
| | දෙපාර්තමේන්තු අත්තිකාරම් ගිණුම් පාලනය | අත්තිකාරම් ගිණුම්වල සීමාවන්ට අනුකූලව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සියළු අයදුම්කරුවන්ට ණය/අත්තිකාරම් ලබාදීම. | අනුමත සීමාවන්ට යටත්ව රු.9,990,346 ක් වූ ආපදා ණය, පාපැදි ණය, විශේෂ අත්තිකාරම් හා උත්සව අත්තිකාරම් ලබාදෙන ලදී. |
| | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | විගණන විමසුම් අවම කිරීම<br>පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට, රාජ්‍ය මුදල් කාරක සභාවට, රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට සහභාගී වීම. | විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එවන ලද සියළු විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදී ඇත. (විගණන විමසුම් 07) |

# 2. 2017 අයවැය විමර්ශනය හා ක්‍රියාත්මක කිරීම.

## 2.1 2017 සඳහා විසර්ජන පනත

2017 වර්ෂය සඳහා වූ විසර්ජන පනත, 2016 දෙසැම්බර් මස 10 වන දින පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද අතර එය 2016 අංක 24 දරණ විසර්ජන පනත වශයෙන් නීතිගත කරන ලදී.

පළමුවන උපලේඛනය, දෙවන උපලේඛනය සහ තුන්වන උපලේඛනය ලෙස උපලේඛන තුනක් විසර්ජන පනතට ඇතුළත් වේ. සෑම උපලේඛනයකටම 2 වගුවේ දක්වා ඇති පරිදි පහත දක්වෙන වියදම් ඇතුළත් වේ.

**2. වගුව: 2017 සඳහා විසර්ජන පනත**

| | | |
|---|---|---|
| **පළමුවන උපලේඛනය** | වැඩසටහන් අනුව රජයේ සාමාන්‍ය සේවාවන් සඳහා වන වියදම් | මුළු වියදම රු.බිලියන 2,113 ක් විය. |
| **දෙවන උපලේඛනය** | නීතියෙන් අධිකාරී බලය ලබාදී ඇති සහ ඒකාබද්ධ අරමුදලෙන් අයවිය යුතු රජයේ වියදම් | වියදම රු.බිලියන 1,515 කි. |
| **තුන්වන උපලේඛනය** | අත්තිකාරම් ගිණුම් කටයුතුවලට අදාළ වියදම් | වර්ෂය සඳහා රාජ්‍ය අයවැයේ දායකත්වය රු.බිලියන 5 කි. |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව/ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

මේ අනුව රජයේ සමස්ත වියදම රු.බිලියන 3,633ක් වූ අතර එයට පුනරාවර්තන වියදම් සඳහා රු. බිලියන 1,947ක්, මූලධන වියදම් සඳහා රු. බිලියන 881 ක් රාජ්‍ය ණය ක්‍රමක්ෂය කිරීම සඳහා රු. බිලියන 800ක් සහ අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා රු .බිලියන 5ක් ඇතුළත් වේ. විසර්ජන පනතේ 2 (1) (ආ) වගන්තිය මගින් රු. බිලියන 1,579ක ණය ගැනීමේ සීමාවක් දක්වා ඇති අතර 2016 වර්ෂයේ අනුරූපී ණය ගැනීමේ සීමාව රු. බිලියන 1,699ක් විය.

### 2.2 2016 අංක 24 දරණ විසර්ජන පනතට සංශෝධන

2017 වර්ෂයේදී රට තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් රටේ ආර්ථික වර්ධනයට බාධා එල්ලවූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය ආදායමේ අඩුවීමක් දැකගත හැකිවිය. ඒ සමගම අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් සහන හා පුනරුත්ථාපන කටයුතු වෙනුවෙන් අමතර අරමුදල්ද අවශ්‍ය විය. රුපියල අවප්‍රමාණය වීම හරහා බාහිරින් එල්ලවූ පීඩනයෙහි ප්‍රතිඵලයක් ලෙස ණය සේවාකරණය සඳහාවූ වියදමද වැඩිවිය. මෙම තත්ත්වය තුළ සතුටුදායක ද්‍රවශීලී අගයක් පවත්වාගනු පිණිස 2016 අංක 24 දරණ විසර්ජන පනතට සංශෝධනය කරමින් 2017 වර්ෂය සඳහා ණය සීමාව ඉහළ නැංවීමට රජය විසින් කටයුතු කරන ලදී.

### 2.3 පරිපූරක ඇස්තමේන්තු

මාර්ග සංවර්ධන ව්‍යාපෘති සඳහා අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීම සහ අත්තිකාරම් ගෙවීම විදේශ මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් නිරවුල් කිරීම සඳහා උසස් අධ්‍යාපන හා මහා මාර්ග අමාත්‍යවරයා විසින් රු. බිලියන 53 ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අවිනිශ්චිත අවස්ථා අරමුදලින් ලබාගන්නා ලද එම මුදල පරිපූරක ඇස්තමේන්තු අරමුදල්වල භාවිතා කිරීමට හැකිවනු පිණිස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් විශේෂ වොරන්ට් බලපත්‍ර අංක 01 නිකුත් කරන ලදී.

### 2.4 පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර

විසර්ජන පනතේ උපලේඛන 2 හි සඳහන් විශේෂ නීති සේවා යටතේ අවශ්‍ය කරන ලද රජයේ විවිධ කාර්යයන් සඳහා වූ අතිරේක අරමුදල් අවශ්‍යතා සපුරාලීම පිණිස මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර පහක් (5) ක් නිකුත් කිරීමට කටයුතු කර ඇත.

**3 වගුව: පරිපූරක ප්‍රතිපාදන ලෙස විශේෂ නීති සේවා වොරන්ට් බලපත්‍ර**

| අංකය | වියදම | | කාර්යය / අරමුණ | ප්‍රමාණය (රු.) |
|---|---|---|---|---|
| | ශීර්ෂය | ආයතනය | | |
| 1 | 07 | අධිකරණ සේවා කොමිෂන් සභාව | කොමිෂන් සභාවේ සාමාජිකයින් වන විනිසුරුවන්ගේ වැටුප් සංශෝධනය කිරිමට අදාළව 2017.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 ට අනුව කොමිෂන් සභාවේ සාමාජිකයින්ට දීමනා ගෙවීම සඳහා | 140,000 |
| 2 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සඳහා වන ඌණතාවය සඳහා | 146,460,000,000 |

| | | | | |
|---|---|---|---|---|
| 3 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | ණය සේවාකරණය වෙනුවෙන් වෙන්කරන ලද ප්‍රතිපාදන සඳහා වන ඌණතාවය සඳහා | 32,100,530,000 |
| 4 | 04 | උපරිමාධිකරණවල විනිසුරුවරුන් | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 මගින් විනිසුරුවන්ගේ වැටුප් වැඩි කිරීමට අනුව ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන්ට වැටුප් වර්ධක ගෙවීම සඳහා | 2,700,000 |
| 5 | 249 | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | පොළී ගෙවීම වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන සඳහා වන ඌනතාවය වෙනුවෙන් | 644,215,000 |

***මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව***

## 2.5 2017 අයවැයෙහි කාර්යසාධනය

2017 වර්ෂයේ රජයේ සමස්ත සත්‍ය වියදම රු.බිලියන 3,470 ක් වූ අතර, එය 2016 වර්ෂයෙහි වියදම් වූ රු.බිලියන 3,106 ට සාපේක්ෂව රු.බිලියන 364 කින් වැඩිවී ඇත. මෙය රු. බිලියන 3,628 ක් වූ ඇස්තමේන්තුගත වියදමට සාපේක්ෂ වූ අතර, එය ඇස්තමේන්තුගත වියදමට වඩා රු.බිලියන 158 ක අඩුවීමකි. 2017 වර්ෂයේ අයවැය ප්‍රතිපාදනවල සමස්ත උපයෝජන අනුපාතය සියයට 96 ක් වූ අතර, එය 2016 වර්ෂයේ සියයට 84ක් වූ කාර්යසාධනයට වඩා සියයට 12ක වැඩි වීමකි.

විසර්ජන පනතේ 2(1) වගන්තිය යටතේ අධිකාරී බලය ලද ප්‍රතිපාදන (සැපයුම් සේවා සඳහා වන වියදම්) වලින් වර්ෂය තුල වියදම් දරා තිබුණේ සියයට 87 ක් පමණක් වන අතර එය 2016 වර්ෂයේ සියයට 69ක් වූ අගයට සාපේක්ෂව වැඩිවීමකි. එයට සමගාමීව රජයේ ප්‍රාග්ධන වියදම් උපයෝජනය කිරීම, රු. බිලියන 881ක් වූ මූලික ඇස්තමේන්තුවෙන් රු. බිලියන 658 ක් හෝ සියයට 75 ක් ලෙස පැහැදිලි වැඩිවීමක් පෙන්නුම් කරන අතර 2016 වර්ෂයේදී එම අගය සියයට 50 ක් විය. පුනරාවර්තන වියදම් උපයෝජනය කිරීම සියයට 91ක් හෝ රු. බිලියන 1,947ක් ලෙස පැවතිනි.

පසුගිය වසර කිහිපය තුළ පැවති ප්‍රවණතාවන්ගෙන් පසුව විශේෂ නීති සේවා වියදම් ඇස්තමේන්තුව (මූල්‍යන සංකේත 21-විසර්ජන පනතේ දෙවන උප ලේඛනය) රු. බිලියන 1,515 ක් වූ මුල් ඇස්තමේන්තුවට වඩා රු. බිලියන 123ක ඉක්මවා යාමක් පෙන්නුම් කරයි. රුපියල අවප්‍රමාණය වීමේ ප්‍රතිඵලයක් ලෙස ණය සේවාකරණය ඉහළ යාම, LIBOR අනුපාත ඉහළ යාම සහ දේශීය හා විදේශීය ණය පොළී අනුපාත ඉහළ යාම, ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් ඉහළ යාමට හේතු විය.

මුළු ඇස්තමේන්තුව වූ රු. බිලියන 2,113 කට සාපේක්ෂව පරිපූරක පනතේ 1 වන උපලේඛනයට අදාළ වියදම රු.බිලියන 1,832ක් වූ අතර, සියයට 87ක ප්‍රගතියක් පෙන්නුම් කරයි. වැඩසටහන 1- මෙහෙයුම් කටයුතු හා වැඩසටහන 2- සංවර්ධන කටයුතු යන වැඩසටහන් ද්විත්වයේම වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි.

4 වගුව: අයවැය ප්‍රතිපාදන උපයෝජනය 2016 - 2017

(රු.බිලියන)

| වියදම් කාණ්ඩය | 2016 | | 2017 | |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුව | වියදම | ඇස්තමේන්තුව | වියදම |
| **විසර්ජන පනත (1 වන උපලේඛනය)** | **2,507** | **1,719** | **2,113** | **1,832** |
| වැඩසටහන 1 | 1,021 | 988 | 965 | 1,011 |
| වැඩසටහන 2 | 1,486 | 731 | 1,148 | 821 |
| **විශේෂ නීතිසේවා (2 වන උපලේඛනය)** | **1,192** | **1,388** | **1,515** | **1,638** |
| **අත්තිකාරම් ගිණුම් (3 වන උප ලේඛනය)** | **5** | **0*** | **5** | **4** |
| **එකතුව** | **3,699** | **3,107** | **3,628** | **3,470** |

*මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

* අයවැයට වඩා ණය ආපසු අයකරගැනීම ඉහළ අගයකි. 2016 වර්ෂයේ අයවැය මගින් වෙන් කරන ලද අරමුදල් භාවිතා කිරීමකින් තොරව අත්තිකාරම් ගිණුම් කටයුතු කළමනාකරණය කරගත හැකිවිය.

2016 සහ 2017 වර්ෂයන්හි රජයේ වියදම්වල මූල්‍යකරණ ප්‍රභවයන් 5 වගුව මගින් පෙන්නුම් කරයි.

5 වගුව: රජයේ වියදම්වල මූල්‍යකරණ ප්‍රභවයන්

| මූල්‍යකරණ අංකය | මූල්‍යකරණ ප්‍රභවය | 2016 රු.බිලියන | 2017 රු.බිලියන |
|---|---|---|---|
| 11 | දේශීය අරමුදල් | 1,466.6 | 1,572.2 |
| 12 | විදේශීය ණය | 205.4 | 214.7 |
| 13 | විදේශීය ප්‍රදාන | 6.9 | 6.3 |
| 14 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය | 207 | 2.1 |
| 15 | ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන | 0.2 | 0.1 |
| 16 | ප්‍රතිපාර්ශවීය අරමුදල් | 0.5 | 0.5 |
| 17 | විදේශ අරමුදල් ආශ්‍රිත දේශීය පිරිවැය | 0.3 | 35.6 |
| 21 | විශේෂ නීති සේවා | 1,387.6 | 1,638.0 |
| | **එකතුව** | **3,106.5** | **3,469.7** |

*මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

6 වගුව: ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

රු.මිලියන

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| | (1) | (2) | (3) | (4) | (5) | (6) |
| විශේෂ වියදම් ඒකක | 17,686 | 5,458 | 3 | 23,147 | 16,466 | 6,681 |
| බුද්ධශාසන | 1,870 | 1,169 | | 3,039 | 2,164 | 875 |
| මුදල් හා ජන මාධ්‍ය | 38,783 | 32,189 | 179,205 | 71,193 | 58,564 | 12,629 |
| ආරක්ෂක | 284,044 | 13,087 | | 297,131 | 278,578 | 18,553 |
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | 14,046 | 40,507 | | 54,554 | 31,578 | 22,975 |
| ආපදා කළමනාකරණ | 4,612 | 12,150 | | 16,761 | 12,374 | 4,388 |
| තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු | 12,550 | 1,044 | | 13,595 | 13,509 | 86 |
| අධිකරණ | 10,231 | 1,167 | | 11,398 | 10,017 | 1,381 |
| සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය | 160,972 | 11,639 | | 172,611 | 146,073 | 26,539 |
| විදේශ කටයුතු | 9,689 | 1,323 | | 11,012 | 9,949 | 1,063 |
| ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා | 51,299 | 21,058 | | 72,357 | 52,160 | 20,197 |
| උසස් අධ්‍යාපන හා මහාමාර්ග | 163,405 | 41,823 | 53,000 | 258,228 | 239,461 | 18,767 |
| කෘෂිකර්ම | 21,394 | 40,805 | | 62,199 | 54,888 | 7,311 |
| විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති | 1,059 | 8,157 | | 9,216 | 8,582 | 634 |
| කාන්තා හා ළමා කටයුතු | 2,699 | 5,905 | | 8,603 | 7,940 | 663 |
| ස්වදේශ කටයුතු | 44,543 | 12,395 | | 56,938 | 40,427 | 16,511 |
| ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ | 9,135 | 365 | | 9,500 | 7,556 | 1,944 |
| නිවාස හා ඉදිකිරීම් | 3,268 | 4,780 | | 8,048 | 8,042 | 5 |
| සමාජ සවිබල ගැන්වීම්, සුභසාධන හා කන්ද උඩරට උරුමයන් | 16,250 | 55,372 | | 71,622 | 66,581 | 5,041 |
| අධ්‍යාපන | 76,944 | 35,970 | | 112,913 | 81,027 | 31,886 |
| රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ | 213,316 | 1,985 | | 215,301 | 214,107 | 1,193 |
| වැවිලි කර්මාන්ත | 8,221 | 2,738 | | 10,959 | 8,209 | 2,749 |
| ක්‍රීඩා | 4,484 | 2,470 | | 6,955 | 4,178 | 2,777 |
| උඩරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන | 3,367 | 1,001 | | 4,368 | 2,425 | 1,943 |
| පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ හා හින්දු ආගමික කටයුතු | 17,441 | 2,344 | | 19,786 | 17,619 | 2,167 |
| ප්‍රාදේශීය සංවර්ධන | 622 | 37 | | 658 | 436 | 222 |
| කර්මාන්ත හා වාණිජ | 192 | 144 | | 336 | 260 | 76 |

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| ඛනිජ තෙල් සම්පත් සංවර්ධන | 9,921 | 5,975 | | 15,896 | 10,370 | 5,527 |
| ධීවර හා ජලජ සම්පත් සංවර්ධන | 312 | 19 | | 331 | 310 | 20 |
| ග්‍රාමීය ආර්ථික කටයුතු | 5,671 | 2,364 | | 8,035 | 5,566 | 2,469 |
| පළාත් පාලන හා පළාත් සභා | 8,330 | 3,206 | | 11,536 | 8,796 | 2,740 |
| ජාතික සහජීවන , ජාතික සංවාද සහ රාජ්‍ය භාෂා | 214,123 | 34,189 | | 248,312 | 216,753 | 31,559 |
| රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | 677 | 401 | | 1,078 | 771 | 306 |
| සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු | 432 | 9,532 | | 9,964 | 1,549 | 8,415 |
| මහවැලි සංවර්ධන හා පරිසර | 855 | 504 | | 1,359 | 634 | 725 |
| තිරසර සංවර්ධන හා වනජීවී | 57,623 | 450 | | 58,074 | 46,195 | 11,878 |
| මහානගර හා බස්නාහිර සංවර්ධන | 3,500 | 169 | | 3,670 | 3,466 | 204 |
| අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු | 15,806 | 24,429 | | 40,234 | 29,972 | 10,263 |
| ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන | 7,928 | 1,240 | | 9,168 | 7,205 | 1,963 |
| නගර සැලසුම් හා ජල සම්පාදන | 1,836 | 1,703 | | 3,539 | 2,815 | 725 |
| විශේෂ කාර්යභාර | 22,846 | 11,396 | | 34,242 | 27,318 | 6,924 |
| වරාය හා නාවික කටයුතු | 118 | 47 | | 165 | 112 | 53 |
| විදේශ රැකියා | 2,363 | 37 | | 2,400 | 620 | 1,780 |
| නීතිය, සාමය හා දක්ෂිණ සංවර්ධන | 695 | 59 | | 754 | 727 | 27 |
| කම්කරු හා වෘත්තීය සමිති සබඳතා | 68,395 | 8,354 | | 76,749 | 71,919 | 4,830 |
| විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් | 5,729 | 76 | | 5,805 | 4,549 | 1,256 |
| සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ | 2,454 | 15,179 | | 17,632 | 1,769 | 15,863 |
| විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ | 955 | 1,081 | | 2,036 | 1,122 | 915 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු | 4,277 | 1,498 | | 5,774 | 3,635 | 2,140 |
| වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ | 9,591 | 1,152 | | 10,743 | 8,301 | 2,442 |
| ප්‍රාථමික කර්මාන්ත | 20,039 | 5,078 | | 25,116 | 18,278 | 6,839 |
| **ණය සේවා ගෙවීම්** | 3,161 | 28 | | 3,189 | 1,617 | 1,572 |

| අමාත්‍යාංශයේ / වියදම් ඒකකයේ නම | ඇස්තමේන්තුගත ප්‍රතිපාදන | භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය මගින් ලබාදුන් අතිරේක ප්‍රතිපාදන | විශේෂ වොරන්ට් බලපත්‍ර සහ පාර්ලිමේන්තුව මගින් ලබාදුන් පරිපූරක ප්‍රතිපාදන | මුළු ප්‍රතිපාදන ((1)+(2)+(3) හි එකතුව) | සත්‍ය වියදම | උපයෝජනය නොකළ ප්‍රතිපාදන (4)-(5) |
|---|---|---|---|---|---|---|
| **භාණ්ඩාගාර විවිධ වැය ශීර්ෂය** | 1,480,275 | | | 1,659,258 | 1,603,049 | 56,209 |
| **මුළු එකතුව** | 488,078 | (485,246) | | 2,832 | | 2,832 |
| විශේෂ වියදම් ඒකක | **3,628,110** | | **232,208** | **3,860,318** | **3,470,589** | **389,729** |

***මූලාශ්‍රය: රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව***

## 2.6 අත්තිකාරම් ගිණුම් කටයුතු

අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා වූ ඇස්තමේන්තුගත උපරිම වියදම් සීමාව රු.බිලියන 26.04 ක් වූ අතර සත්‍ය වියදම රු.බිලියන 25.56 ක් විය. ඇස්තමේන්තුගත අවම ලැබීම් සීමාව රු.බිලියන 21.04 ක් වූ නමුත්, සත්‍ය මුළු ලැබීම් ප්‍රමාණය රු.බිලියන 21.53 ක් විය. ඒ අනුව, අත්තිකාරම් ගිණුම් කටයුතු 2016 අංක 24 දරණ විසර්ජන පනතේ සඳහන් අනුමත සීමාවන් තුල සිදුකර ඇත. මෙම අත්තිකාරම් ගිණුම් කටයුතුවලට වාණිජමය ස්වභාවයේ ක්‍රියාකාරකම් මෙන්ම, දේපළ හා වාහන ණය හැර රාජ්‍ය සේවකයින් සඳහා අත්තිකාරම් ලබාදීමද අන්තර්ගත වේ. රාජ්‍ය සේවකයින් සඳහා ලබාදුන් සමස්ත අත්තිකාරම් ප්‍රමාණය රු.බිලියන 17.51 ක් විය. 2017 වර්ෂයේ මැයි මස සිදුවූ හදිසි ගංවතුර හා නාය යාම් හේතුවෙන් පීඩාවට පත් රජයේ සේවකයින් සඳහා පොළී රහිත විශේෂ ආපදා ණය ලබා දෙන ලදී. මෙම ණය මුදල් නිදහස් කිරීම සඳහා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ ඇස්තමේන්තුගත උපරිම වියදම් සීමාවන් සංශෝධනය කිරීමට කටයුතු කරන ලදී.

2005 වර්ෂයේ සිට රජයේ සේවකයින්ගේ දේපළ ණය සහ වාහන ණය රාජ්‍ය බැංකු හරහා ලබාදෙන ලදී. 2017 වර්ෂය තුළදී රජයේ සේවකයින් 8,349 දෙනෙකු සඳහා දේපළ ණය ලෙස රු. බිලියන 10.91 ක් රාජ්‍ය බැංකු මගින් නිදහස් කරන ලද අතර රජය විසින් රු. බිලියන 2.62ක් ණය පොළී සහනාධාර වශයෙන් ලබා දී ඇත.

## 2.7 2017 අයවැය කළමනාකරණය

### 2.7.1 අරමුදල් මාරු කිරීම

වීරමොං පටිපාටිය යටතේ සහ විසර්ජන පනතේ 5 වන වගන්තිය පරිදි, මුදල් රෙගුලාසි සහ මුද්‍රිත ඇස්තමේන්තුවල දක්වා ඇති නියමයන් අනුගමනය කරමින් පාර්ලිමේන්තුව විසින් අනුමත කර ඇති මුළු වියදම් සීමාවන් ඇතුලත උපයෝජනය කර නොමැති ප්‍රතිපාදන මාරු කිරීමට මහා භාණ්ඩාගාරය මගින් අනුමැතිය ලබාදෙන ලද අතර 2017 වර්ෂය තුළදී අරමුදල් මාරු කිරීම සඳහා වූ ඉල්ලීම් 1,601ක් සඳහා මහා භාණ්ඩාගාරය විසින් අනුමැතිය ලබාදී ඇත.

### 2.7.2 පරිපූරක සහාය සේවා හා හදිසි අවශ්‍යතා වගකීම්

වියදම් කිරීමේ ආයතනයන්හි පුරෝකථනය කළ නොහැකි හදිසි අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සලසා දීම සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් වැය ශීර්ෂ 240 යටතේ පරිපූරක සහාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ද ක්‍රියාත්මක කරන ලදී.

අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන ප්‍රතිපාදන ද ඇතුලත්ව මෙම ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ සමස්ත ප්‍රතිපාදනය රු.බිලියන 488 ක් වූ අතර එයින් රු.බිලියන 268 ක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද අවශ්‍යතා ඇගයීම මත පදනම්ව අමතර ප්‍රතිපාදන ලෙස අදාළ වියදම් ආයතන වෙත නැවත මාරුකර ඇත. සියළුම අමතර ප්‍රතිපාදන 2017 වර්ෂයේ මුද්‍රිත අයවැය ඇස්තමේන්තුවෙහි දක්වා ඇති විශේෂිත උපදෙස් මාලාවට අනුව නිකුත් කර ඇත. ප්‍රතිපාදන පිළිබඳ සාරාංශයක් 7 වගුවේ දක්වා ඇත.

**7 වගුව: විසර්ජන පනතේ 6 වන වගන්තිය යටතේ වෙන්කර ඇති ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය**

| | මුද්‍රිත ඇස්තමේන්තුවල දක්වා ඇති කාර්යය | ප්‍රමාණය (රු.මිලියන) |
|---|---|---|
| 1. | සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන | 133,243 |
| 2. | අනපේක්ෂිත වියදම් සඳහා වූ ප්‍රතිපාදන | 36,128 |
| 3. | අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන | 268,205 |
| 4. | බදු සහ තීරුබදු ඇතුළත්ව විදේශ මූල්‍යන සහ ආශ්‍රිත ප්‍රතිපාර්ශවීය අරමුදල් මගින් අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති ඇතුළත් මූලධන වියදම්හි ඌනතා සපුරාලීම සඳහා | 50,500 |
| | **එකතුව** | **488,076** |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

